# පුරප්පාඩු

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

### දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ශ්‍රී ලංකා රජය (GoSL) විසින් දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) සඳහා ලෝක බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 76 ක ණය මුදලක් ලබා ගෙන ඇත. කාලගුණය, ගංවතුර සහ නායයෑම් පුරෝකථනය කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය නවීකරණය කිරීම මගින් දිවයින පුරා සිටින මිලියන 11.2 ක පමණ ජනතාවකට සහන සැලසීම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ.

දේශගුණික  බලපෑම අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශයෙහි (CResMPA) ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (PCU) සඳහා පූර්ණ කාලීන "කොන්ත්‍රාත් පදනම" මත සේවය කිරීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ | B | 01 |
| 2 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශේෂඥ (අධීක්ෂණ, ඇගයීම් සහ ඉගෙනුම් - MEL) | C | 01 |
| 3 | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥ | C | 01 |
| 4 | ධාරිතා සංවර්ධන විශේෂඥ | C | 01 |
| 5 | මුදල් කළමනාකරු | C1 | 01 |
| 6 | ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රසම්පාදන) | D | 03 |
| 7 | ව්‍යාපෘති ඉංජිනේරු (කොන්ත්‍රාත් කළමනාකරණය) | D | 03 |
| 8 | සැපයුම් දම කළමනාකරු (Logistic Manager) | E | 01 |
| 9 | සමාජ ආරක්ෂණ නිලධාරී | F | 03 |
| 10 | පාරිසරික නිලධාරී | F | 02 |
| 11 | ඉඩම් නිලධාරී | F | 02 |
| 12 | මානව සම්පත් කළමනාකරණ නිලධාරී | F | 01 |
| 13 | ප්‍රසම්පාදන නිලධාරී | F | 01 |
| 14 | ඉංජිනේරු සහකාර | F | 02 |
| 15 | සැලසුම් ශිල්පී (Draughtsman) | F | 02 |
| 16 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහකාර | F | 01 |
| 17 | කළමනාකරණ සහකාර | - | 03 |
| 18 | රියදුරන් | - | 03 |
| 19 | කාර්යාල සහකාර | - | 02 |

ඉහත තනතුරු සඳහා (අංක 1 සිට 16 දක්වා) වැටුප් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) අංක 01/2026 දරන චක්‍රලේඛයේ උපලේඛන 1 හි 03 වන වගුවේ 03 වන තීරුවේ දක්වා ඇති අතර, මූලික සුදුසුකම් සහ පළපුරුදු අවශ්‍යතා එම චක්‍රලේඛයේම 02 වන වගුවේ විස්තර කර ඇත.

| | | | |
|---|---|---|---|
| 17 | කළමනාකරණ සහකාර | - | 03 |

**✻ අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:**

අපොස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවන්, ගණිතය සහ තවත් විෂයන් දෙකක් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයක් සමත්ව තිබිය යුතුය. ඉංග්‍රීසි භාෂාවෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව සහ පරිගණක සාක්ෂරතාවය සමඟ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**✻ වැටුප් මට්ටම:** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 පරිදි වේ

| | | | |
|---|---|---|---|
| 18 | රියදුරු | - | 03 |

**✻ අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:**

අපොස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ ඇතුළු විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත්ව තිබිය යුතු අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතුය (අපේක්ෂිත ප්‍රවීණතාවය පැහැදිලිව සඳහන් කළ යුතුය). රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**✻ වැටුප් මට්ටම:** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 19 | කාර්යාල සහකාර | - | 02 |

**✻ අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:**

අපොස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) සමත්ව තිබිය යුතු අතර, සාමාන්‍ය කාර්යාල සහාය සහ ලිපිකරු රාජකාරි, ලිපිගොනු හැසිරවීම, ලේඛන හැසිරවීම සහ කාර්යාලයේ දෛනික කටයුතුවලදී නිලධාරීන්ට සහාය වීම සඳහා හැකියාව තිබිය යුතුය.

**✻ වැටුප් මට්ටම:** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 පරිදි වේ.

**සාමාන්‍ය කොන්දේසි :**

1. **වයස:** අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 63 ට නොවැඩි විය යුතුය.
2. **වැටුප් පරිමාණය:** 2026.02.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2026 සහ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව දීමනා සහිත රජයේ අනුමත වැටුප් පරිමාණය හිමිවේ.
3. මෙම තනතුරු මුළුමනින්ම කොන්ත්‍රාත් පදනම මත වන අතර, මුලින් **2026 දෙසැම්බර් 31** දක්වා වන අතර කාර්ය සාධනය සහ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම මත පදනම්ව සේවා කාලය දීර්ඝ කළ හැකිය.
4. **අයදුම්පත් යොමු කිරීම:**

   අයදුම්කරුවන් ඔවුන්ගේ ජීව දත්ත පත්‍රිකාව (CV) අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ විස්තර සහිතව ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, තේරීම් දක්ෂතාවය මත පදනම් වේ. මූලික සුදුසුකම් ඔප්පු කිරීම සඳහා සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමඟ අමුණා තිබිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීම් නුසුදුස්සෙකු වීමට හේතු වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   අයදුම්පත් 2026 මාර්තු 26 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA), අංක 11, ජාවත්ත පාර, කොළඹ 05 යන ලිපිනයට යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**13.03.2026**